කොවිඩ්-19 වාර්තාකරණයේදී මාධ්‍යවේදීන් සැලකිලිමත් විය යුතු එක් ප්‍රධාන කරුණක් වන්නේ, ආසාදිතයන් හා ඔවුන්ගේ ආශ්‍රිතයන් හැඳින්වීමේදී භාවිතා කරනා භාෂාවයි. මන්දයත්, කොවිඩ්-19 ආසාදිතයන් සහ ආශ්‍රිතයන් කෙරෙහි සමාජය තුළ ගර්හාවක් සහ කොන් කිරීමේ ආකල්පයක් ඇති කරවීමටද මාධ්‍ය මගින් භාවිතා කරනු ලබන භාෂාව හේතු විය හැකි බැවිනි.

කොවිඩ්-19 ආසාදිතයින් පිළිබඳව වාර්තා කිරීමේදී "Covid-19 cases" හෝ "covid-19 victims" යනුවෙන් සඳහන් කිරීමෙන් වළකින ලෙසත්, ඒ වෙනුවට "people who have Covid-19", "people who are being treated for Covid-19", "people who are recovering from Covid-19", "people who died after contracting Covid-19" යනාකාරයෙන් ඔවුන් පිළිබඳව වාර්තා කරන ලෙසත් මේ සම්බන්ධයෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් සහ වෙනත් පාර්ශවයන් මගින් හඳුන්වා දී ඇති මාර්ගෝපදේශන මාලාව තුළ දැක්වී තිබීම ඊට උදාහරණයකි.

නමුත් Dailymirror (11/12) සහ The Island (11/12) පුවත්පත් තුළ Covid-19 victims සහ Corona victims යනුවෙන් සඳහන් වී තිබෙනු අපට නිරීක්ෂණය කළ හැකි විණි.

එනිසා, කොවිඩ්-19 සම්බන්ධ වාර්තාකරණයේදී භාවිතා කරනු ලබන භාෂාව සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් වන ලෙසත්, කොවිඩ්-19 වාර්තාකරණයේදී ආචාර ධාර්මිකව කටයුතු කරන ලෙසත් Dailymirror සහ The Island ඇතුළු සියලුම මාධ්‍ය වෙත සිහිකැඳවීමට මෙය අවස්ථාව කර ගනිමු.

මූලාශ්‍ර:

https://www.who.int/docs/default-source/ coronaviruse / covid19 -stigma-guide.pdf

https://erj.ersjournals.com/.../2020/06/25/13993003.02461-2020

#COVID19 #MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #Dailymirror #TheIsland